# 6 සීල්එක ලියාපදිංචි කිරීම / සීල්එක ලියාපදිංචිකළ සහතිකය
## ( *Inkantōroku / Inkantōroku Shōmeisho* )
## < සීල් එක ( *Hanko* එක ) ලියාපදිංචි කිරීම >



ජපානයේ නම ලිවීම වෙනුවට සීල් < *Hanko* > එක භාවිතා කිරීම සිදු කෙරේ.
( අත්සන භාවිතා කිරීම වෙනුවට < සීල් එක > තමගේ නම යොදා සාදා ගතයුතුවේ. )
වැදගත් ලිය කියවිලි සඳහා සීල් එක < *Hanko* > භාවිතා කිරීමේදී එය ලියාපදිංචිකර තිබීම අවශ්‍ය වේ.
වාහන, ඉඩම්, ගොඩනැගිළි ආදිය මිළදී ගැනීමේදී සහ විකිණීමේදී මෙය භාවිතා කරනු ලැබේ.
සමාගමක් සෑදීමේදී ද සීල්එක අවශ්‍ය වනු ලැබේ.
සීල් එක ලියාපදිංචි කිරීමේදී නගරසභාවේ <මහජන සම්බන්ධතා අංශය ( *Shiminka* ) > ටපැමිණ ඉල්ලුම් කරන්න.

## (1) සීල් එක < *Hanko* > <u>ලියාපදිංචි</u> කරන ස්ථානය

වයස අවුරුදු 15 ත් ඉහල සත්මු නගරයේ පදිංචි පුද්ගලයින් වේ නම් සත්මු නගරසභාවේ < මහජන සම්බන්ධතා අංශය ( *Shiminka* ) > හෝ නගරසභාවේ අනුශාඛා වලදී සීල්එක <u>ලියාපදිංචි</u> කළහැක.
<u>ලියාපදිංචි</u> කළවිට <u>සීල් එක ලියාපදිංචි කළ කාඩ් පත ( *Tōroku Kādo* )</u> නිකුත් කරනු ලැබේ.




## (2) සීල්එක ලියාපදිංචි කිරීම

| කවුද? | රැගෙන යායුතු දේ | නගරසභාවට පැමිණි දිනයේදී ලියාපදිංචි කළනොහැකි විට |
|---|---|---|
| ඔබ නගරසභාවට පැමිණ සීල්එක <u>ලියාපදිංචි කිරීම</u> | ① ලියාපදිංචි කරන සීල් එක < *Hanko* ><br>② ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* )<br>↓<br>**එම දිනයේදීම ලියාපදිංචි කළ හැක.** | ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) නොමැති පුද්ගලයින්ට, පසුව ලිපික් මගින් දැනුම දෙනු ලබනවා.<br>ඔබ විසින් ලිපියට අදාල පිළිතුරු ලියා, දින 14ට පෙර නගරසභාවට රැගෙන එන්න.<br>↓<br>**දින කීපයක් ගතවන විට සීල්එක ලියාපදිංචි කළහැක.** |

| කවුද? | රැගෙන යායුතු දේ | නගරසභාවට පැමිණි දිනයේදී ලියාපදිංචි කළනොහැකි විට |
|---|---|---|
| ඔබ වෙනුවට වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණ <u>ලියාපදිංචි කිරිම</u> | ① ලියාපදිංචි කරන සීල්එක < *Hanko*><br>② පැවරුම් ලිපිය ( *Ininjō* )<br>③ ඔබ වෙනුවට පැමිණි පුද්ගලයාගේ < සීල් එක ><br>④ ඔබ වෙනුවට පැමිණෙන පුද්ගලයාගේ <u>රියදුරුබ බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* )</u> හෝ එම පුද්ගලයා බව තහවුරු කෙරෙන ඡායාරූපය ඇතුලත් වෙනත් ලියවිල්ලක් | ඔබ වෙනුවට වෙනත් පුද්ගලයෙකු පැමිණි අවස්ථාවේදී ඔබට තැපැලෙන් ලිපියක් යවනු ලැබේ.<br>ඔබ විසින් එම ලිපියට පිළිතුරු ලියා ඔබ හෝ ඔබ වෙනුවට පැමිණෙන පුද්ගලයා දින 14 ක් ඇතුළත කරුණාකර නගරසභාවට එම ලිපිය රැගෙන පැමිණිය යුතුයි.<br>↓ |
| | **දින කිහිපයක් ගත වූවාටපසුව සීල් එක ( *Inkan* ) ලියාපදිංචි කළ හැකිය** | |

## (3) ලියාපදිංචි කළනොහැකි සීල් වර්ග < *Hanko* > පහත සදහන් දෑ වේ

① පවුලේ අනෙක් අය ලියාපදිංචි කර ඇති සීල්.
② ලියාපදිංචි සහතිකයේ සදහන් නමට වෙනස් නමකින් සෑදූ සීල් < *Hanko* >
③ නමට අමතරව වෙනස් දෙයක් සදහන් කරඇති සීල් < *Hanko* >
④ මිලිමීටර් 8කට වඩා ප්‍රමාණයෙන් කුඩා සීල් < *Hanko* >
⑤ මිලිමීටර්25කට වඩා විශාල සීල් < *Hanko* >
⑥ රබර් වලින් සාදන ලද සීල් < *Hanko* >
⑦ නම පැහැදිළි ලෙස නොපෙනෙන සීල් < *Hanko* >



ලියාපදිංචි කළනොහැකි සීල් < *Hanko* >

## (4) සීල්එක ලියාපදිංචි කර ඇති සහතිකය ( *Inkantōroku Shōmeisho* ) ලබාගැනීම

ඔබගේ සීල්එක < *Hanko* > ලියාපදිංචිකිරීමෙන් අනතුරුව සීල්එක ලියාපදිංචි කළ සහතිකය ( *Inkantōroku Shōmeisho* ) ඉල්ලුම්කළහැක.
නගරාසභාවේ < මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) > හෝ උපනගර සභා කාර්යාල වලට ගොස් ඉල්ලුම් කළහැකිය.

<නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ>

① සීල්එක ලියාපදිංචි කළ සහතිකය ( *Inkan Tōrokushō* ) < *Tōroku Kādo* >
② මුදල්යෙන් 300 ක්



— සටහන් —



◎ 17 පිටුවේ සහ 18 වෙනිපිටුවේඅමාරු වචන ◎

※ලියාපදිංචි ( කිරීම ) ( *Tōroku* ) : ( මෙම පිටුවේ සඳහන් ආකාරයට ) ඔබගේ සීල් එක < *Hanko* > නගරසභාවේ ලියාපදිංචිකිරීම

※සීල්එක ලියාපදිංචි කළ කාඩ්පත ( *Tōroku Kādo* ) : ඔබගේ සීල් එක < *Hanko* > ලියාපදිංචිකල විට ලැබෙන කාඩ්පත. බොහෝ වටිනා දෙයක් වන බැවින් කරුණාකර එය ආරක්ෂා කාරීව නැතිනොවන ලෙස වගබලා ගන්න.

※රියදුරු බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* ) : රිය පැදවීමට සුදුසු යැයි සඳහන් කරඇති,ඔබගේ මුහුණේ චායාරූපයක් සඳහන් වන බලපත්‍රය.

| ලියකියවිලි ඉදිරිපත් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සම්බන්ධතා අංශය<br>( *Shiminka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක② | 0475-80-1141 |
| සන්බු උප නගරසභාව<br>( *Sanbu Shutchōjo* ) | 1884-1 හනියා, සන්මු නගරය<br>( 1884-1,Haniya,Sammu-shi ) | 0475-89-3600 |
| හසුණුමා උප නගරසභාව<br>( *Hasunuma Shutchōjo* ) | 233 බන්චි,හසුණුමාහා,සන්මු නගරය<br>( 233,Hasunuma ha,Sammu-shi ) | 0475-86-3111 |
| මත්සුඔ උප නගරසභාව<br>( *Matsuo Shutchōjo* ) | 3012 බන්චි,ගොතන්දා,මත්සුඔ මචි,සන්මුනගරය<br>(3012,Matsuomachi gotanda,Sammu-shi ) | 0479-80-7117 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. වේලාසනින් නගරසභාවට පැමිණ ඉල්ලුම් කරන්න.